# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 91/10 — 1973 දෙසැම්බර් 28 වැනි සිකුරාදා — 1973.12.28**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

**ජනා.කා. අංකය : සී 349/72.**

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

සහ

**1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාව**

ජාතික රාජ්‍ය සභාවේ මන්නාරම මන්ත්‍රීවරයාගේ ආසනය පුරප්පාඩු වී ඇති බව, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 36 (2) වැනි වගන්තිය යටතේ ජාතික රාජ්‍ය සභාවේ ලේකම් විසින්, 1973 නොවැම්බර් මස 29 වැනි දින දරණ ලිපියෙන් මා වෙත දන්වනු ලැබ ඇති හෙයින්,

ශ්‍රී ලංකා ජනරජයේ ජනාධිපති තැන්පත්, විලියම් ගොපල්ලව වන මම, ඉහත කී වගන්තියෙන් සහ 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාවේ 27 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මේ දැන්වීමෙන්—

(1) ඉහත කී පුරප්පාඩුව පිරවීම පිණිස මැතිවරණයක් පවත්වන ලෙස අණ කරමි. තවද,

(2) එම මැතිවරණය සඳහා අපේක්ෂකයන්ගේ නාම යෝජනා කිරීමේ දිනය වශයෙන් 1974 ජනවාරි මස 24 වැනි දිනය ද, ස්ථානය වශයෙන් මන්නාරම කච්චේරිය ද නියම කරමි.

**වි. ගොපල්ලව,**
**ජනාධිපති.**

1973 දෙසැම්බර් මස 28 වැනි දින,
කොළඹ දී ය.


**ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.**

1A— ඒ 3792—1,200 (73/12)